ගොවිතැනට අත දෙන මිනිස්සු

# ඉඩම් අක්කරයෙන් ජය මාවතට

**කොළඹ පෞද්ගලික ආයතනයක සේවය කළ ඇම්. ජයරාමන් මහතා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පත්‍රිකා කිහිපයක්ද ගෙන වවුනියාවට ගියේය. එම පත්‍රිකාවල ආධාරයෙන් මාස තුන හතරක් මහන්සියෙන් ඔහුට රැකියාවෙන් ලැබුනු වාර්ෂික ආදයමට වඩා ආදයමක් ලබා ගැනීමට හැකිවිය. අද ඔහු එදට වඩා විසිතිස් ගුණයකින් ආදයම් ලබන නව අත්හද බැලීම් වලින් කෘෂිකර්මය දියුණු කරන, අසල්වැසි සහෝදර ගොවීන්ට ආධාර උපකාර කරන හොඳ ගොවි නායකයෙකි.**

නව වගා රටාවෙන් සිය ජීවිතය සාර්ථක කර ගත් දූන් වවුනියාවේ වලිකුලම්වල වෙසෙන ජයරාමන් මහතා, සිය ජීවිතයේ සන්ධිස්ථානය ගැන ගොවි ජනතාවට කරුණු පැහැදිලි කිරීම ඇරඹුවේ මේ අයුරිනි. ''මම කොළඹ සාප්පුවේ වැඩ කරන විට, නැවතී සිටියේ කොම්පඤ්ඤ වීදියේ. එහි තිබුන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති සේවාවෙහි මම වගා උපදෙස් පත්‍රිකා ගෙන කියවූවා. කොළඹ ජීවිතයෙන් කලකිරී සිටි මට ඒ පත්‍රිකා අනුව වගා ආරම්භ කළොත් සාර්ථක වේදූයි කියලා හිතුවා. ඒ අනුව වවුනියාවේ මාන්කුලම් වලට ඇවිත් අක්කර යක් මිලදී ගත්තා. ඒ 1973 දී ඒ ඉඩමේ එම උපදෙස් පත්‍රිකා අනුව, මිරිස් වගා කළවිට, රාත්තල් 1,000 ක පමණ අස්වැන්නක් ලැබුණා. ඒ කාලයේ විශාල මුදලක් වන රුපියල් 8,000 ක් පමණ ලබා ගැනීමට මට හැකි වුනා.''

''ඊට පසුව මං රතුළූණු වගා කළා. ඒ කාලයේ මිශ්‍ර වගාව ගැන ගොවීන්ගේ උනන්දුව අඩුයි. ඒ වුනත් මං හිතුවා ඒ ක්‍රමයත් අත්හද බලන්නට අවශ්‍යය කියා. ඒ අනුව මම රතුළූනු වගාව සමග වම්බටු වගා කළා. එයින් ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබුනා.''

''මෙලෙස වගා කිරීම ආරම්භ කළ පසු අපට පෙනී ගිය කරුණක් තමයි, අපට ඇති සුළු ඉඩම් ප්‍රමාණයෙන් වැඩි ආදයමක් ලබා ගැනීමට නම්, ඉතා කෙටි කාලයකින් අස්වැන්න ලබාගත හැකි බෝගයක් වැවිය යුතු බව. ඒ අනුව අපේ මීළඟ අවධානය යොමු වුනේ රටකජු වගාවට.''

**වැසි ජලය අඩුවෙන්ම ලැබෙන වවුනියා ප්‍රදේශයට වැසි ජලයම විටෙක විශාල බාධාවක්. වැස්ස මැනවින් ලැබෙන මහ කන්නයේ දී කුඹුරු වල වී ගොවිතැන් කිරීමටත්, ගොඩ ඉඩම් වල බෝග වගාවටත් ඉඩකඩ**



ඇම්. ජයරාමන් මහතා

**ලැබෙන්නේ නෑ. ඒ නිසා මෙයට විසඳුමක් වවුනියාවේ ගොවීන් සොයා ගෙන තිබෙනවා. එය වවුනියා දිස්ත්‍රික්කයටම පමණක් සීමාවී පවතින ගොඩ වී ගොවිතැන. මෙම ගොවිතැන කෙරෙහිද උනන්දුවක් දක්වූ ජයරාමන් මහතාට එයිනුත් දියුණුවක් ලබන්නට හැකි වුනා. වවුනියාවේ මඩ ගොවිතැනින් ලැබෙන්නේ අක්කරයකට වී බුසල් 60 ක් පමණ වුවත්, ගොඩ ගොවිතැනින් ජයරාමන් මහතා, වී බුසල් 90 ක් ලබනවා. මෙයට හේතුව විමසූ විට, ඔහුගේ**

**පිළිතුරට කරුණු තුනක් ඇතුලත් වුනා. පළමුවැන්න අඩු වයසැති අභිජනනය කල බිත්තර වී භාවිතා කිරීම. දෙවැන්න වගා උපදෙස් අනුවම කලට වේලාවට නිසි පරිදි වගාව රැක බලා ගැනීම. තුන් වැන්න රසායනික පොහොර වලට වැඩි අවධානයක් යොමු නොකර, ගොම වැනි දේශීය පොහොර වලට නැඹුරු වීම. මේ කරුණු තුන පැහැදිලි කළ ඒ මහතා, වැඩි අස්වැන්නක් ලැබීමට නම් අභිජනන වී වර්ග වගා කළයුතු බව කීය. උදහරණයක් වශයෙන් ඔහු වගා කරන්නෙ බතලගොඩ අභිජනන මධ්‍යස්ථානයේ නිෂ්පාදනයක් වන බී ජී 34/8 දරණ වී වර්ගයයි.**

එහෙත් අභිජනනය කළ වී වර්ගවල ප්‍රශ්න නැත්තේ නොවේ. ඉන් මූලික එකක් නම්, එම වී වගාව අවසන් වන තුරුම හොඳින් රැක බලා ගතයුතු බවයි. පොහොර යෙදිය යුතු දිනය සතියක් පමණ ප්‍රමාද කර පොහොර යෙදුවහොත් එම වගාවෙන් සාර්ථක ප්‍රතිඵල ගත නොහැකි බව ජයරාමන් මහතා ගේ අදහසයි.

**රසායනික පොහොර ප්‍රමාණයට වඩා යෙදීම පසට හානිකර බව කී ජයරාමන් මහතා, එයට පිලියම් ලෙස පෙන්වා දෙන්නේ, රසායනික පොහොර ප්‍රමාණය අඩුකර ගොම පොහොර යෙදිය යුතු බවයි. එමගින් පස ආරක්ෂා වෙනවා මෙන්ම එම පොහොරද වසර දෙකකට පමණ පස සාරවත් කිරීමට ප්‍රමාණවත් බවත් ඒ මහතා පෙන්වා දුන්නා.**

අපේ ඉල්ලීම අනුව ගොඩ ගොවිතැන සඳහා අක්කරයකට යන වියදම පහත සඳහන් ආකාරයට ඒ මහතා පෙන්වා දුන්නා—

| | | | රු. ශ. |
|---|---|---|---|
| පස සකස් කිරීම | ... | ... | 750.00 |
| බිත්තර වී | ... | ... | 100.00 |
| පැල සිටුවීම | ... | ... | 400.00 |
| පොහොර | ... | ... | 375.00 |
| කෘමි නාශක | ... | ... | 125.00 |
| අස්වැන්න නෙලීමේ කටයුතු (ට්‍රැක්ටර් කුලියද ඇතුලත්ව) | ... | ... | 1,250.00 |
| | | | 3,000.00 |

ගොඩ ගොවිතැනින් වී බුසල් 90 ක් පමණ ලැබෙන නිසා එමගින් රු. 6,300 ක් පමණ ආදයමක් ලැබේ. ඒ අනුව කන්නයකදී අක්කරයකින් රුපියල් 3,000 ක පමණ ලාබයක් ගත හැකියි.

වෙනත් බොහෝ ප්‍රදේශවල ගොවියන්ට ඇති වගා ණය පිළිබඳ ප්‍රශ්නය ජයරාමන් මහතාට නැත. ඔහු කිසි දිනක වගා ණය ගෙන නැත. තම ගොවිතැන මැනවින් සැලසුම් කළහොත් වගා ණය අවශ්‍ය නැතැයි ඒ මහතා කියයි.



ගොඩ ගොවිතැනින් ලබා ගන්නා අස්වැන්නට අඩු ප්‍රමාණයක් කුඹුරු ගොවිතැනින් ලැබීමට හේතුව කුමක්දැයි විමසූ විට ජයරාමන් මහතා කීවේ, ගොවි තැනට අවශ්‍ය සැළකිල්ල එම ගොවීන්ගෙන් නො ලැබෙන නිසා එසේ වී ඇති බවයි.

"ගොවිතැන නොසැලකිල්ලෙන් කළහැකි සේවා වක් නොවේ. එය දරුවෙක් හද ගන්නා වැනි සැලකිල්ලකින් හා විමසිල්ලකින් කළයුතු දෙයක්" ලෙසයි, ඔහු ගොවිතැන හඳුන්වන්නේ.

ගොවිතැනට ඇති සැලකිල්ල හේ සිය පවුලටද දක්වනවා. ඔහුගේ වැඩිමහල් දරුවා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන අතර අනෙක් දරුවන් දෙදෙනාම පාසැල් යති. මේ සැලකිල්ල හා විමර්ශන බුද්ධිය ඔහුට ජයමාවත සකස් කරදී ඇත්තේය.